# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය**

## ශිල්ප කලා - I / II

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 3 යි

### ශිල්ප කලා - I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01) අතීතයේ සිට මේ දක්වා පැවත එන සාමාන්‍ය ජනයාගේ කලා හැකියාවන් හඳුන්වන්නේ,
   1) ශ්‍රව්‍ය කලා ලෙස ය
   2) ශ්‍රව්‍ය දෘශ්‍ය කලා ලෙස ය
   3) ජනකලා ලෙස ය
   4) විදග්ධ කලා ලෙස ය

02) ජනකලාවක් තුළින් ආරම්භ වී වර්තමානයේ මහා පරිමාණ කර්මාන්තයක් බවට පත්ව ඇති කර්මාන්තය වන්නේ
   1) ලාක්ෂා කර්මාන්තය
   2) මැටි කර්මාන්තය
   3) ලී කැටයම් කලාව
   4) පිත්තල කර්මාන්තය

03) ලාක්ෂා කර්මාන්තය සාම්ප්‍රදායිකව පවත්වා ගෙන එනු ලබන ප්‍රදේශ සහිත පිළිතුර තෝරන්න.
   1) පල්ලෙහපුවිද, පිළිමතලාව, මිරිස්ස
   2) අගුල්මඩුව, හුරීකඩුව, පල්ලෙහපුවිද
   3) පිළිමතලාව, මිරිස්ස, හුරීකඩුව
   4) මිරිස්ස, උඩුපිළ, හුරීකඩුව


04) විදේශිකයන්ගෙන් අප ලද දායාදයක් වන වර්තමානයේ ඉතා ජනප්‍රිය ජන කලාවක් වන්නේ
   1) ස්වර්ණාභරණ කර්මාන්තය
   2) පිත්තල කර්මාන්තය
   3) බීරළු රේන්ද කර්මාන්තය
   4) වෙස්මුහුණු කර්මාන්තය

05) $15^\circ$ ගුණාකාරයෙන් යුත් අගයයන් සහිත කෝණ පහසුවෙන් නිර්මාණය කිරීමට භාවිතා කළ හැකි ජ්‍යාමිතික උපකරණ වන්නේ
   1) කෝණමානය හා පැන්සල
   2) කෝදුව හා පැන්සල
   3) කවකටුව හා පැන්සල
   4) විහිත චතුරස්‍රය හා පැන්සල

06) ඇඳීමේ කඩදාසියක ජාත්‍යන්තර වර්ගීකරණය අනුව $A4$ ප්‍රමාණයේ කඩදාසියක ප්‍රමාණය වන්නේ
   1) 841mm x 1189 mm
   2) 210 mm x 297 mm
   3) 297 mm x 420 mm
   4) 148 mm x 210 mm

07) කාර්මික ඇඳීමේ දී වස්තුවක පෙනෙන දර දැක්වීම සඳහා භාවිතා කරන රේඛා වර්ගය කුමක්ද?
   1) දෙකෙළවර ඝනදම රේඛා ය
   2) සිහින් දම රේඛා ය
   3) ඝන අඛණ්ඩ රේඛා ය
   4) නිදහස් අතින් අඳින රේඛා ය

08) මෙම වෘත්ත නිර්මාණය සඳහා වෘත්තයක කුමන කොටස් උපයෝගී කර තිබේද?



   1) වෘත්ත ඛණ්ඩය හා ජ්‍යාය යි
   2) වෘත්ත පාදය හා ජ්‍යාය යි
   3) කේන්ද්‍රික ඛණ්ඩය හා ජ්‍යාය යි
   4) අරය හා ජ්‍යාය යි

09) පහත ලක්ෂණ සහිත චතුරස්‍රය වන්නේ
   - පාද සමාන වන අතර සම්මුඛ කෝණ සමාන වේ.
   - විකර්ණ අසමාන නමුත් එකිනෙක ඍජු කෝණී ව සමච්ඡේදනය කරයි.
   - සම්මුඛ පාද සමාන්තර වේ.

   1) ත්‍රපීසියම
   2) සමචතුරස්‍රය
   3) රොම්බසය
   4) රොම්බාභය

10) සංවෘත තල රූපයක අවම පාද ගණන වන්නේ

1) 3 2) 2 3) 4 4) 6

11) සායම් භාවිතයෙන් රෙදි පිළි අලංකරණයේ දී භාවිතා කරන ප්‍රධාන ක්‍රමයක් නොවන්නේ මින් කුමක්ද?

1) සායම් ආලේපණය 2) සායම් පෙවීම

3) මුද්‍රණය 4) සායම් ඉසීම

12) අතීතයේ වර්ණ ගැන්වීම සඳහා පාරම්පරිකව ස්වභාවික සම්පත් භාවිතයට ගෙන ඇතග රයිසෝම යනු

1) මැටි වර්ගයකි 2) අල වර්ගයකි

3) ශාක තෙල් වර්ගයකි 4) සත්ව තෙල් වර්ගයකි

13) අතීතයේ මෙරටට ආනයනය කරන ලද "සාදිලිංගම්" නම් ද්‍රව්‍යයෙන් ලබා ගත් වර්ණය වන්නේ

1) සුදු වර්ණය 2) කහ වර්ණය 3) රතු වර්ණය 4) කළු වර්ණය

14) කහ, කස්තුරි, ඇලම් හොඳින් කුඩු කොට තල තෙල් සමඟ මිශ්‍ර කර සාද ගන්නා ආලේපනය භාවිතා කරන්නේ කුමන කාන්තාවන් ද?

1) හින්දු කාන්තාවන් ය 2) මුස්ලිම් කාන්තාවන් ය

3) සිංහල කාන්තාවන් ය 4) මැලේ කාන්තාවන් ය

15) මූලික වර්ණ දෙකක් සම්මිශ්‍රණය වීමෙන් ද්විතියික වර්ණ ගොඩනැගේ. නිල් හා රතු වර්ණ මිශ්‍ර වීමෙන් සැදෙන වර්ණය වන්නේ

1) කොළ වර්ණය 2) තැඹිලි වර්ණය 3) කහ වර්ණය 4) දම් වර්ණය

16) වර්ණ ආලේපකරණයේ දී "යටි ආලේපය" යනු?

1) තද වර්ණයක් සමස්ත මෝස්තරය පුරාම ආලේප කිරීමයි.

2) තුනී පාරදෘශ්‍ය සායම් පදසයක් ආලේප කිරීමයි.

3) අභිමත වර්ණයකින් සමස්ත මෝස්තරයම පුරවා ගැනීමයි.

4) ලා වර්ණයක් සමස්ත මෝස්තරය පුරාම ආලේප කිරීමයි.

17) පෙර පිරියම් කිරීමේදී ශාක කෙඳිවලට කැඳ යොදනු ලබන්නේ

1) නූල්වල මෘදු ගතිය ඇති කිරීමට ය. 2) නූල්වල ශක්තිය ඇති කිරීමට ය.

3) නූල්වල සායම් අවශෝෂණය පහසු කිරීමට ය. 4) නූල්වල සුදු පැහැය ඇති කිරීමට ය.

18) ලෝම කෙඳි සඳහා සිදුකරන පෙර පිරියම් ක්‍රමයක් වන්නේ

1) කැඳහරණය 2) මැලියම්හරණය

3) මලහරණය 4) කාබනීකරණය

19) සායම් ආලේපකළ හෝ මුද්‍රණය කළ රෙදිපිළි සඳහා පසුපිරියම් ක්‍රම සිදුකරනු ලබන්නේ

1) වර්ණ ස්ථිර කිරීම සඳහා ය. 2) යොද ඇති වර්ණ ලා පැහැ වීම සඳහා ය.

3) යොද ඇති වර්ණ තද පැහැයක් වීම සඳහා ය. 4) වර්ණ සම්මිශ්‍රණය වීම වැළැක්වීමට ය.

20) රෙදි පිළි අලංකරණයේ දී පින්සල් වැනි සම්මත උපකරණ භාවිතයෙන් තොරව සිදුකරන ශිල්පීය ක්‍රම හඳුන්වන්නේ

1) සිදුරු තහඩු මුද්‍රණය 2) සංකීර්ණ පින්තාරු ක්‍රම

3) සරල පින්තාරු ක්‍රම 4) අච්චු මුද්‍රණ ක්‍රම

21) රෙදි පින්තාරු කිරීමේ දී පින්සල අත්‍යාවශ්‍ය උපකරණයකි. පින්සලක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සහිත පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A- ස්වභාවික කෙඳිවලින් සැකසූ පින්සල් විශිෂ්ට ගුණයෙන් යුතුය.


B- පින්සලයේ ඇති කෙඳිවල ඝනකම අනුව පින්සල් අංක කෙරේ.

C- වර්ණ ගැල්වීමෙන් පසු පිසද තැබිය යුතුය.

D- පින්සල් සැකසීමට වඩාත් සුදුසු වන්නේ කෘතිම කෙඳි භාවිතයයි.

1) A D 2) B C 3) C D 4) A B

22) පහත මෝස්තරය යොදාගෙන රෙදි පිළි අලංකාර කරගත හැකි ක්‍රමය වන්නේ



1) අච්චු මුද්‍රණ ක්‍රමයටය
2) සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමයටය
3) තිර රාමු මුද්‍රණ ක්‍රමයටය
4) ගැට පඬු මුද්‍රණ ක්‍රමයටය

23) පෙහෙකම් කෙඳි වර්ගීකරණයේ දී මැනිලා, නියඳ, ලිනන්, පෙනා යන කෙඳි වර්ග අයත්වන කාණ්ඩය වන්නේ
1) ශාකමය කෙඳි
2) සත්ත්වමය කෙඳි
3) ඛනිජමය කෙඳි
4) ස්වාභාවික පොලිමර කෙඳි

24) අතීතයේ දී කපු කැටීම සඳහා භාවිතා කර ඇත්තේ
1) චරකය
2) තක්ලීය
3) අත් යන්ත්‍රය
4) ජවනඩාව

25) ලෝකයේ ඉතා දුර්ලභ වර්ගයේ ලෝම ලබා ගන්නා සත්වයෙකු වන්නේ
1) ඔටුවා
2) ලාමා
3) විකුණා
4) ඇල්පකා

26) ඛනිජ කෙඳිවල ප්‍රධාන ගුණයක් නොවන්නේ මින් කුමක්ද?
1) අධික තාපයට ඔරොත්තු දෙයි.
2) අම්ලයන්හි දිය නොවේ.
3) කෙඳි ලෙස පොළවෙන් ලබා ගත හැක.
4) ඉක්මනින් ගිනි නොගනී.


27) කෙඳි හඳුනාගැනීමේ පරීක්ෂණ අතර පිළිස්සුම් පරීක්ෂාවේ දී පහත ලක්ෂණ දැකිය හැකි කෙඳිවර්ගය වන්නේ
- වහා ගිනි ගැනීම.
- කහ පාට ලොකු ගිනිදලු ඇතිවීම.
- කඩදාසි පිළිස්සෙන ගඳ වහනය වීම.

1) කපු
2) ලිනන්
3) ලෝම
4) සේද

28) විසිතුරු ඉන පටි, මිත්‍රත්ව පටි, ඔරලෝසු පටි ආදිය පහසුවෙන් විවීම සඳහා භාවිතා කළ හැකි ක්‍රමය වන්නේ
1) විවීමේ යන්ත්‍රය භාවිතයෙන් විවීම.
2) ගොතන කටුව ආධාරයෙන් ගෙතීම.
3) බීරළු කොට්ටය ආධාරයෙන් ගෙතීම.
4) හැඩපෙති ආධාරයෙන් විවීම.

29) රෙදි පිළි නිෂ්පාදනයේ දී ප්‍රධාන වශයෙන් විවීමේ රටා කොටස් තුනකට වෙන් කෙරේ. එම ප්‍රභේද තුන වන්නේ
1) චාම්, ජටා, දික් දාර ය
2) සරල දාර, දික් දාර, හරස් දාර ය
3) ජටා, දික් දාර, හරස් දාර ය
4) චාම්, ගීරි, සැටින් ය

30) මෙම වියමන් රටා දෙකෙන් දැක්වෙන්නේ



1) චාම් වියමන, දික්දර වියමන
2) ජටා වියමන, දික්දර වියමන
3) ජටා වියමන, හරස්දර වියමන
4) චාම් වියමන, හරස්දර වියමන

31) මැටි භාණ්ඩ තැනීම අතීත මානව ශිෂ්ටාචාරයේ ආරම්භය දක්වා දිවයයි. මැටි නිර්මාණය වන්නේ කුමන පාෂාණය ජීර්ණය වීමෙන් ද?
1) ෆෙල්ස්පාර්
2) ක්වාට්ස්
3) ඩොලමයිට්
4) කබොක් ගල්

32) මැටි හඳුන්වන රසායනික නාමය වන්නේ
1) ඇලුමිනියම් ඔක්සයිඩ් ලෙස ය
2) ඇලුමිනා සිලිකේට් ලෙස ය
3) සිලිකන් ඩයොක්සයිඩ් ලෙස ය
4) ෆෙල්ස්පාර් ලෙස ය

33) පහත ලක්ෂණ අඩංගු මැටි වර්ගය වන්නේ
- නිර්මාණය වූ ස්ථානයේ ම තැන්පත් වේ.
- පැහැයෙන් සුදු වර්ණයක් ගනී.
- නම්‍යතාවයෙන් අඩුය.

1) ප්‍රාථමික මැටි
2) ද්විතියික මැටි
3) මකුළු මැටි
4) ගිනි මැටි

34) භාණ්ඩ නිෂ්පාදනය සඳහා සුදුසු පරිදි මැටි සකස් කිරීමල මැටි පදම් කිරීම නම් වේග මැටි පදම් කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක වන්නේ

1) ග්‍රාමීය ලෙස හා මහා පරිමාණ ලෙස ය
2) ග්‍රාමීය ලෙස හා ග්‍රාමීය කර්මාන්ත ලෙස ය
3) කුඩා කර්මාන්ත ලෙස හා ග්‍රාමීය කර්මාන්ත ලෙස ය
4) තෙත මැටි හා වියළි මැටි ලෙස ය

35) අධික මිලකින් යුත් පෝසිලේන් භාණ්ඩ මැටි කර්මාන්තයේ ප්‍රගතිය විදහා දක්වයි. දන්තාලේප, පුයර, තීන්ත වර්ග ආදිය සඳහා යොද ගන්නා මැටි වර්ගය කුමක්ද?

1) කිරිමැටි 2) අගම් මැටි ය 3) පිහිටි මැටි ය 4) තලප මැටි ය

36) දහවල් කාලයේ රත් වී ප්‍රසාරණය වීමත් රාත්‍රී කාලයේ ක්ෂණිකව සිසිල් වී සංකෝචනය වීමත් නිසා මාතෘ පාෂාණය පුපුරා යයි. එය සිදුවීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ

1) සූර්ය තාපය
2) හිමපතනය
3) අව්ව වැසි ඇති වීම
4) ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය

37) හැඩපෙති ආධාරයෙන් විවීම ඉතා පැරණි වියමන් ක්‍රමයකි. හැඩපෙති භාවිතා කර ඉන පටියක් විවීමට භාවිතා නොකරන නූල් වර්ගය වන්නේ

1) ශක්තිමත් කපු නූල් ය
2) මැක්‍රම් නූල් ය
3) ලිනන් නූල් ය
4) සෙල්ගාර නූල් ය

38) මැටි තහඩු භාවිතා කර භාණ්ඩ සෑදීම විවිධ හැඩතල සහිතව විවිධ ප්‍රමාණවලින් සිදුකෙරේ. මැටි තහඩුව මඳක් හැරීමෙන් මතු කර ගන්නා කැටයම වනුයේ

1) අර්ධ උන්නත කැටයමයි
2) අධි උන්නත කැටයමයි
3) අල්ප උන්නත කැටයමයි
4) සිදුරු කැටයමයි

39) රෙදි පිළි අලංකරණයේ දී විසිතුරු මැහුම් ක්‍රම යොද ගැනේ. පහත දැක්වෙන මැහුම් ක්‍රම අතරින් විසිතුරු මැහුම් ක්‍රමයක් වන්නේ

1) නූල් ඇදීමයි
2) පිස්මේන්තු මැස්මයි
3) නූල් දුවවීමයි
4) ලේසි ඩේසි මැස්මයි

40) රෙදි කැබලි කිසියම් රටාවකට ගොනුකොට ඇලවීමෙන් හෝ මැසීමෙන් කරනු ලබන නිර්මාණ හඳුන්වන්නේ

1) ඇප්ලික් නිර්මාණ
2) කොස්ට්‍රිප් නිර්මාණ
3) පැච්වර්ක් නිර්මාණ
4) එම්බෝස් නිර්මාණ